සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samadhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/MF/05/02/01-බාහිර විගණනය | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2021.01.20 |
|---|---|---|---|---|---|

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කලමනාකරුවන්,

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කලමනාකරුවන්,

විධායක කමිටු / පාලක මණ්ඩල සභාපතිවරුන්.

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති බාහිර විගණනය</u>**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති බාහිර විගණනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2020/13 ට වැඩිමනක් වශයෙනි.

02. අදාල චක්‍රලේඛයේ අනු අංක 08 දක්වා ඇති පරිදි 2015 – 2019 දක්වා බාහිර විගණනයට අදාල විගණන ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් පහත උපදෙස් පරිදි කටයුතු කල යුතුය.

03. බාහිර විගණනය සඳහා වන වියදම් ඒ ඒ බැංකු හා බැංකු සමිති විසින් දැරිය යුතුය. දිස්ත්‍රික් විගණන නිලධාරීන් විසින් ඒ ඒ බැංකු / බැංකු සමිති වලට අදාල බාහිර විගණනය සිදු කිරීමෙන් පසුව අදාල විගණන වාර්තාව දෙපාර්තමේන්තුවේ විගණන අංශයට යොමු කිරීමට කටයුතු කරන අතර , එම වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ විගණන අංශය මගින් විගණන මතයක් ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ලබා දීමට කටයුතු කරයි. අදාල විගණන මතය ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලැබීමෙන් පසුව අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය මගින් එම මතය පදනම් කර ගනිමින් ඉදිරි කටයුතු සම්බන්ධව උපදෙස් බැංකු / බැංකු සමිති වෙත ලබා දීමට කටයුතු කරනු ඇත.

04. එම උපදෙස් ලිපිය ලැබී දින 07 ක් ඇතුලත අදාල විගණන ගාස්තුව ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත එවීමට කලමනාකරු විසින් කටයුතු කල යුතුය.

ඒ අනුව එක් විගණන වර්ෂයක් වෙනුවෙන් රු.3000/- ක මුදලක් බාහිර විගණන ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.එම ගාස්තුව අනිවාර්යයෙන්ම චෙක්පතකින් **<u>"කලමනාකරු , ලංකා බැංකුව බත්තරමුල්ල , ප්‍රජාමූල බැංකු අංශය ආයෝජන ගිණුම , ජංගම ගිණුම් අංක 3417925 "</u>** නමට ලියා


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288** |

අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය. චෙක්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවර <u>" **බාහිර විගණන ගාස්තු**"</u> වශයෙන් සටහන් කරන්න.

05. එසේම ගෙවන ලද විගණන ගාස්තුව කුමන වර්ෂයට අදාලව ද යන්න සඳහන් කර ආවරණ ලිපියක් ද සමඟ චෙක්පත එවීමට කටයුතු කල යුතුය.

06.ඉහත කටයුතු සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් ඇති වුවහොත් **011-2887301 / 0761497983 දුරකථන අංක මගින් සමෘද්ධි කලමනාකරු මැණිකේ මිය** ඇමතීමට කටයුතු කරන්න.

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් -**

01. ලේකම් , සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා උඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.පි.
02. දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක ඩ අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.පි.
03. විගණන අධිකාරී ,රජයේ විගණන අංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
05. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
06. ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
07. අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
08. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
09. අධීක්ෂණ කලමනාකරු / අධීක්ෂණ නිලධාරී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.